## 1. <u>නිර්වචනය හා අර්ථ නිරූපනය</u>

### 1.1. <u>නිර්වචන</u>

**"ගිණුම"** යන්නෙන්, ඔබේ නමින් අප බැංකුවේ පවතින (යම් අතුරු ගිණුමක් ඇතුළුව) යම් බැංකු ගිණුමක් අදහස් වේ.

**"බලපාන නියමය"** යන්නෙන් අපැහැදිලි, පරස්පර විරෝධී, සාවද්‍ය, අසම්පූර්ණ, බල විරහිත හෝ අදාළ යම් නීතියක් නියෝගයක් හෝ යම් අධිකාරයක අවසරයක් උල්ලංඝනය විය හැකි අප සිතන යම් නියමයක් අදහස් වේ.

**"අනුබද්ධ"** යන්නෙන්, සමාගමක් සම්බන්ධයෙන්,

(අ) එහි වෙනත් යම් පාලිත සමාගමක්,

(ආ) එහි වෙනත් යම් පාලක සමාගමක්, හෝ

(ඇ) ඒ පාලක සමාගමේ වෙනත් යම් ඕනෑම පාලිත සමාගමක්,

ප්‍රධාන කාර්යාලය ඇතුලුව ඉහත සඳහන් ශාඛා අදහස් වේ.

**"ගිවිසුම"** යන්නෙන්, මෙම සම්මත නියමයන්, අදාළ ප්‍රාදේශීය අතිරේක, අදාළ සේවා අතිරේක සහ පාර්ශ්වයන් අතර එකඟතාවයක් ඇති කරගන්නා ලද වෙනත් යම් නියමයන් සහ කොන්දේසි අදහස් වේ.

**"ඉල්ලුම්පත්‍ර ආකෘතිය"** යන්නෙන්, (අතිරේක ඉල්ලුම්පත්‍ර ආකෘතියක් ඇතුළුව) කිසියම් සේවාවක් සඳහා අප වෙත ඔබට ඉල්ලුම් කළ හැකි වන්නා වූ අප විසින් සපයන හෝ ඔබට ලබාගත හැකි ඉල්ලුම් පත්‍ර ආකෘතියක් අදහස් වේ.

**"බලයලත් තැනැත්තා"** යන්නෙන්, ඔබ වෙනුවෙන් ක්‍රියා කිරීමට නියෝග කරමින් බලය දරන ලෙස ලිඛිතව ඔබ විසින් නම් කරන ලද යම් තැනැත්තකු අදහස් වේ.

**"අධිකාරිය"** යන්නෙන්, අප හෝ බැංකු සාමාජිකයකු සම්බන්ධයෙන් අධිකරණ බලය සහිත යම් රජයක්, අර්ධ රාජ්‍යයක්, පරිපාලන නියාමන හෝ අධීක්ෂණ මණ්ඩලයක් හෝ අධිකාරියක්, අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක් අදහස් වේ.

**"බැංකු දිනය"** යන්නෙන්, සේවා ස්ථානවල දී සාමාන්‍ය බැංකු කටයුතු සඳහා බැංකු විවෘතව තබන දිනය අදහස් වේ.

**"බැංකු සාමාජිකයා"** යන්නෙන්, ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් පීඑල්සී සමාගම හෝ එයට අනුබද්ධ ඕනෑම ආයතනයක් අදහස් වේ.

**"නාලිකා"** යන්නෙන්, සේවාවන්වලට ප්‍රවේශවීමට සහ ඒවා භාවිත කිරීමට ඔබට හැකියාව ලබාදීම පිණිස අප විසින් පිහිටුවන ලද (අන්තර්ජාල, දුරකථන, SWIFT පණිවුඩ, ජංගම උපාංග, ෆැක්ස් සහ විද්‍යුත් තැපැල් ඇතුළුව) යම් පද්ධතියක්, මාධ්‍ය හෝ නාලිකාවන් අදහස් වේ.

**"සේවාදායක කණ්ඩායම් සාමාජික"** යන්නෙන්, ඔබ හෝ ඔබගේ අනුබද්ධිතයන් කිසිවෙකු අදහස් වේ.

**"සේවාදායක හඳුනාගැනීම"** යන්නෙන්, ඔබ වෙත වෙන්කළ හෝ ඔබ විසින් තෝරාගත් ආවේනික හඳුනාගැනීමේ ක්‍රමයක් {මුරපදයක් (password), රහස්‍ය අංකයක් (PIN), පුද්ගල හඳුනාගැනීමේ හෝ ඉලෙක්ට්‍රොනික යතුරක් ආකාරයේ සම්මිශ්‍රණයක්) අදහස් වේ.

**"සේවාදායක පද්ධති"** යන්නෙන්, තොරතුරු කිසිවක් සම්ප්‍රේෂණය කිරීමට හෝ ලබාගැනීමට ඔබ විසින් සපයාගත් සහ භාවිතා කරන ලද කිසියම් සන්නිවේදන මාර්ගයක්, මොඩම් සම්බන්ධතාවයක් හෝ වෙනත් පහසුකම්, මෘදුකාංග, දෘඩාංග, ජංගම උපාංග හෝ උපකරණ අදහස් වේ.

**"පාලනය"** යන්නෙන්, යම් තැනැත්තෙකු (ඍජුව හෝ වක්‍රව යන දෙකෙන් එක් අන්තයකට සහ නැතහොත් කොටස් ප්‍රාග්ධනයෙන්, ඡන්ද බලයෙන් ගිවිසුමකින් හෝ අන්‍යාකාරයකින්) තවත් පුද්ගලයකුගේ පාලන මණ්ඩලයේ බහුතර සාමාජිකයන් පත්කිරීමට හෝ ඉවත්කිරීමට බලය ඇති හෝ අන්‍යාකාරයෙන් පාලනය කිරීමට හැකි හෝ අනෙක් පුද්ගලයාගේ ව්‍යාපාර කටයුතු සහ ප්‍රතිපත්ති පාලනය කිරීමට බලය ඇති විට අනෙක් පුද්ගලයා පළවන පුද්ගලයාගේ පාලනයට නතුවන ලෙස සැලකේ.

**"ප්‍රාදේශීය අතිරේකය"** යන්නෙන්, සේවා ස්ථානයක් සඳහා වන එක් එක් ප්‍රාදේශීය අතිරේකයන් අදහස් වේ.

**"ඩිජිටල් සහතික"** යන්නෙන්, ඉලෙක්ට්‍රොනික පණිවිඩ තහවුරු කිරීමට, හඳුනාගැනීමට හෝ සුරක්ෂිත කිරීමට භාවිතා කරන ඉලෙක්ට්‍රොනික උපාංගයක් අදහස් වේ.

**"ඉලෙක්ට්‍රොනික යතුරු"** යන්නෙන්, ස්මාර්ට් කාඩ්, ආරක්ෂිත සලකුණු, ඉලෙක්ට්‍රොනික යතුරු හෝ ඒ හා සමාන සත්‍යාපනය කිරීමේ හෝ තහවුරු කිරීමේ භෞතික උපක්‍රම අදහස් වේ.

**"අනුපාතික බලපෑම"** යන්නෙන්,

(අ) ගංවතුර, කුණාටු, භූමිකම්පා හෝ වෙනත් ස්වභාවික ආපදා අවස්ථා,

(ආ) යුද්ධ, සටන්, ත්‍රස්තවාදය, විප්ලව, කැරලි, හෝ සිවිල් කලකෝලහල,

(ඈ) වර්ජන, සේවයෙන් පිටමං කිරීම හෝ වෙනත් කාර්මික ක්‍රියාමාර්ග,

(ඇ) යම් නීතියක් වෙනස්වීම හෝ යම් නීතියක අර්ථකථනය හෝ බලාත්මකභාවය වෙනස්වීම,

(ඉ) යම් අධිකාරියක ක්‍රියාවන් හෝ නියෝගයන්,

(ඊ) යම් අධිකරණයක හෝ වෙනත් අධිකරණ මණ්ඩලයක නියෝගයක්,

(උ) විදේශ විනිමය බැරකිරීම් හෝ මාරු කිරීම මත පවතින සීමා කිරීම සහ ආසන්න සීමා කිරීම්,

(ඌ) පරිගණක පද්ධතිය නිසි ලෙස ක්‍රියා නොකිරීම හෝ ඇනහිටීම හෝ පරිගණක පද්ධතියට යම් තුන්වන පාර්ශ්වයකින් සිදුවන බාධා,

(එ) තුන්වන පාර්ශ්වයක් විසින් ඔබට හෝ අපට සපයන ලද යම් භාණ්ඩයක හෝ සේවාවක දෝෂ, බිඳ වැටීම්, බාධා කිරීම්, ප්‍රමාදවීම් හෝ ලබා ගත නොහැකි බව, හෝ

(ඒ) අපගේ බුද්ධි ගෝචර පාලනය ඉක්මවා යන වෙනත් අවස්ථාවෝචිත කරුණු.

**"පාලක සමාගම"** යන්නෙන්, සමාගමකට අදාළව යම් සමාගමක් වෙනත් සමාගමක පාලිත සමාගමක් වන්නේ නම්, ඒ වෙනත් සමාගම ඒ මුලින් කී සමාගමේ පාලක සමාගම යන්නෙන් අදහස් වේ.

**"බුන්වත්භාවය පිළිබඳ නීති කාත්‍යය"** යන්නෙන්,

(අ) ගෙවීම්, ණයගැතිබවේ විලම්භන කාලය, ගණන් බේරා වසා දැමීම, විසුරුවා හැරීම, පරිපාලනය සහ (ණය ගෙවිය හැකි ඇවරකිරීමක් හෝ ප්‍රතිසංවිධානයක් හැර) ප්‍රතිසංවිධානයක් හෝ ණයකරුවන් සමඟ සම්මුතියක් හෝ එකගවීමක් අත්හිටුවීමට,

(ආ) ඔබ වෙනුවෙන් හෝ ඔබගේ යම් වත්කමක් සම්බන්ධයෙන් (ණය ගෙවිය හැකි ඇවරකිරීමක් සම්බන්ධයෙන් හැර) ඇවරකරුවෙකු, ප්‍රතිග්‍රාහකයෙකු පරිපාලකයකු හෝ සමාන නිලධරයෙකු පත් කිරීමට,

(ඇ) ඔබගේ වත්කම් කිසිවකට බලපාන හෝ ඔබගේ වත්කම් මත යම් සුරක්ෂිතභාවය පිළිබඳ බලාත්මක වන හිමිකම පවරා ගැනීමට, ඇදා ගැනීමට, තහනම් කිරීමට, පරිග්‍රහණය කිරීමට හෝ ඇස්කීසි කිරීමට, හෝ

(ඈ) කිසියම් සදෘශ්‍ය ක්‍රියාමාර්ගයකට හෝ කිසියම් අධිකරණ ක්‍රියා මාර්ගයකට යටත්වීමට

අදාළ සංස්ථාපිත ක්‍රියාමාර්ගයක්, නීතිමය ක්‍රියාමාර්ගයක් හෝ වෙනත් පියවරක් අදහස් වේ.

**"නියමයන්"** යන්නෙන්, කිසියම් ගිණුමක ගනුදෙනු හෝ සේවා සම්බන්ධයෙන්

(අ) නියමයන් ක්‍රියාවට නැංවීමට අපට අවශ්‍ය කරන තොරතුරු ඇතුළත් වන,

(ආ) අප විසින් ගිවිසගත් ඕනෑම මාර්ගයක් හරහා අපට ලැබෙන, සහ

(ඇ) සද්භාවයෙන් බලයලත් තැනැත්තෙකු විසින් ලබා දී ඇති බවට හෝ අප විසින් නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි යම් පරීක්ෂා හෝ තහවුරු කිරීම් සමග සම්ප්‍රේෂණය කර ඇති බවට අප විසින් විශ්වාස කරන,

යම් ගිණුමකට, ගනුදෙනුවකට හෝ සේවාවකට අදාළ නියමයන් ආදර්ශවන අතර, "**නියම කිරීම යන්නට**" අනුරූපී අර්ථය ම තිබිය යුතු ය.

"**බුද්ධිමය දේපල අයිතිවාසිකම්**" යන්නෙන්, යම් සොයා ගැනීමක්, පේටන්ට් බලපත්‍රයක්, නිර්මාණ හෝ උපයෝගීතා නිරූපණ අයිතිවාසිකම්, ලාංඡන, කර්තෘ හිමිකම, වෙළඳ සලකුණු, සේවා ලාංඡන දත්ත සමුච්චය පිළිබඳ අයිතිවාසිකම්, භූලක්ෂණ සිතියම්වල අයිතිවාසිකම, වාණිජ හෝ රහසිගත තොරතුරු, දැනුම් හැකියාව හෝ අලෙවි රහස් සහ සමාන ස්වාභාවයක හෝ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී නොමැති දේපල සහ ඒවාට අදාළ වන අයිතිවාසිකම් ඇතුළුව ඕනෑම ස්ථානයක පවතින ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය බුද්ධිමය සහ කාර්මික දේපල යම් අයිතිවාසිකමක් අදහස් වේ.

"**අලාභ**" යන්නෙන්, යම් අලාභ, හානි, ඉල්ලීම්, හිමිකම්පෑම, වගකීම්, ගාස්තු (නීති වියදම් ඇතුළුව) සහ පූර්වාපේක්ෂණය කළ හැකි හෝ නොහැකි හෝ සිදුවීමේ හැකියාවක් තිබෙන හෝ නොතිබෙන යම් ආකාරයක වියදමක් (යම් සෘජු, වක්‍ර හෝ ආනුශංගික අලාභ, ලාභ අහිමිවීම, හොඳහිත අහිමිවීම හා කීර්තිය අහිමිවීම ඇතුළත්ව) අදහස් වේ.

"**අක්‍රමවත් උපාංග**" යන්නෙන්, වයිරස, වර්ම්, ට්‍රෝජන්, බැක්ඩෝ, ස්පයිවෙයා හෝ කීලොගර් වැනි පරිගණක පද්ධතියට හානිදායක වයිරස ඇතුළු සතුරු, ආගන්තුක, කඩාකප්පල්කාරී අනර්ථකාරී හෝ සංහාරක මෘදුකාංග අදහස් වේ.

"**බලපත්‍රය**" යන්නෙන්, ඔබ වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බලය පවරනු ලැබූ තැනැත්තන් වෙත ලබා දෙනු ලබන ඔබගේ සංස්ථාගත බලය පැවරීම අදහස් වේ.

"**ජංගම උපාංග**" යන්නෙන්, සේවාවකට පිවිසීම සඳහා පරිශීලකයකු හෝ බලය පවරනු ලැබූ අයෙකු විසින් නම් කරන ලද ඕනෑම ජංගම සන්නිවේදන උපාංගයක් අදහස් වේ.

"**දැන්වීම**" යන්නෙන්, පහත සඳහන් ක්‍රම මඟින් අප විසින් ඔබ වෙත තොරතුරු අනාවරණය කිරීම අදහස් වේ.

(අ) වාචිකව,

(ආ) අපගේ නිලධරයකු මඟින් භාරදීම,

(ඇ) ලිඛිත තැපෑලෙන්, ෆැක්ස් මඟින් හෝ විද්‍යුත් තැපැල් මඟින්, සහ

(ඇ) අපගේ වෙබ් අඩවියේ දැක්වීමෙන්,

ඒ අනුව "**දැනුම් දෙන ලදී**", "**දැනුම් දෙමින්**", සහ "**දැන්වීම**" යන්නට ඒ හා අනුරූපී තේරුම් තිබිය යුතුය.

"**පාර්ශ්වකරුවන්**" යන්නෙන්, ඔබ සහ අප අදහස් වේ.

"**ගෙවීම් සාධන පත්‍රය**" යන්නෙන්, යම් චෙක්පතක්, සංචාරක චෙක්පතක්, ඉල්ලුම් අණකරයක්, මුදල් භාරකාර ඇණවුමක්, මුදල් ඇණවුමක්, තැපැල් ඇණවුමක්, හෝ වෙනත් සමාන සාධන පත්‍රයක් අදහස් වේ.

"**පුද්ගලික තොරතුරු**" යන්නෙන්, ඔබේ නම, ලිපිනය, බදුගෙවීමේ හඳුනාගැනීමේ අංකය, වෙනත් ආකාරයක හඳුනාගැනීමක් ඇතුළුව ඔබගේ ඍජු හා වක්‍ර අර්ථලාභී හිමිකරුවන් ගේ හඳුනාගැනීමක්, අර්ථලාභීන්, පාලනය කරනු ලබන පුද්ගලයන්, සහ ඔවුන්ගේ අදාළ දත්ත විෂයයන් අනුපිළිවෙලින් අදහස් වේ.

"**රහස්‍ය අංකය**" යන්නෙන්, භාවිතා කරන්නකුට හෝ යම් නිශ්චිත ඉලෙක්ට්‍රොනික පිවිසුමකට සුවිශේෂ වූ රහස්‍ය සංකේත අංකය අදහස් වේ.

"**අදාළ දත්ත විෂය**" යන්නෙන්,

(අ) යම් අයදුම් පත්‍රයක් හෝ සේවා සැපයීමේ ආකෘති පත්‍රයක් ලියා අත්සන් කරනු ලබන හෝ එහි නම් කර ඇති තැනැත්තකු,

(ආ) ඔබගේ බලය පවරනු ලැබූ තැනැත්තා, හෝ

(ඇ) එවැනි තැනැත්තෙකු වශයෙන් අප විසින් නිශ්චය කරනු ලබන තැනැත්තෙකු අදහස් වේ.

"**වාර්තාව**" යන්නෙන්, යම් ගිණුමකට, මුදල් ගනුදෙනුවකට හෝ සේවයකට අදාළව ඔබ විසින් ඉල්ලා සිටින ලද යම් දත්ත, වාර්තා, ප්‍රකාශ හෝ තොරතුරු අදහස් වේ.

"**පරිසීමිත පාර්ශ්වය**" යනු නීතිය මඟින් ගනුදෙනු කිරීම සීමාකර ඇති හෝ තහනම් කර ඇති එක්සත් ජනපද හෝ යුරෝපා සංගමයේ සාමාජික රටක ජාතිකයෙකු වේ.

"**සම්බාධක**" යන්නෙන්, එක්සත් ජනපදයේ, යුරෝපා සංගමයේ හෝ එහි වෙනත් සාමාජික රාජ්‍යයන් හි රජයයන් මඟින් පනවන ලද ආර්ථික සම්බාධක නීති, රෙගුලාසි, වෙළඳ කටයුතු පිළිබඳ තහනම් හෝ බාධක ක්‍රියාමාර්ගයන් අදහස් වේ.

"**ආරක්ෂක කාර්යය පටිපාටි**" යන්නෙන්, අප විසින් ආරක්ෂාව හෝ සත්‍යාපනය උදෙසා ඔබ වෙත ලබා දෙනු ලබන උපදෙස්, නිර්දේශයන්, ක්‍රියාමාර්ග හෝ කාර්ය පටිපාටි අදහස් වේ.

"**සේවා**" යන්නෙන්, කිසියම් උපයෝගී ක්‍රියාකාරකම්, ගනුදෙනු හෝ සේවාවන් ද ඇතුළුව අප විසින් ඔබ වෙත ලබා දෙනු ලබන බැංකු පහසුකම්, මාර්ගගතය(න්), මෙහෙයුම් කර්තව්‍ය සහ නිෂ්පාදන හා මූල්‍ය සේවා (ගිණුමක් හා අදාළව හෝ එසේ නොවන) ආදී දෑ අදහස් වේ.

.

"**සේවා මට්ටම් ගිවිසුම්**" යන්නෙන්, පාර්ශ්වයන් අතර එකඟ වී ඇති පරිදි යම් සේවයක් ලබාදීම සඳහා වන කාර්යය පටිපාටියක හා මෙහෙයුම් නියමයන් අදහස් වේ.

"**සේවය ලබාදෙනු ලබන ස්ථානය**" යන්නෙන්, අදාළ ඉල්ලුම් පත්‍රයේ හඳුනාගෙන ඇති අප විසින් ඔබ වෙත සේවාවන් ලබා දෙනු ලබන හා අප කටයුතු කරනු ලබන රට හෝ දේශභූමිය අදහස් වේ.

"**සේවා අතිරේකය**" යන්නෙන්, ඔබ විසින් තෝරා ගන්නා ලද සේවයකට අදාළ අපගේ නියමයන් අදහස් වේ.

"**සේවා සැපයීමේ ආකෘතිපත්‍රය**" යන්නෙන්, ඔබ විසින් යම් සේවයක් සඳහා ඉල්ලා සිටිනු ලබන සේවා සැපයීමේ විකල්පනයන් දක්වා ඇති ආකෘතිපත්‍රයක් අදහස් වේ.

"**මෘදුකාංග**" යන්නෙන්, අප හෝ අපගේ සැපයුම්කරු විසින් ඔබ වෙත ලබා දෙන ලද යම් මෘදුකාංගයක් අදහස් වේ.

"**මෘදුකාංග බලපත්‍රය**" යන්නෙන්, එම මෘදුකාංගය සම්බන්ධයෙන් ඔබ වෙත හෝ අප වෙත ලබා දෙන ලද යම් බලපත්‍රයක් අදහස් වේ.

"**සම්මත නියමයන්**" යන්නෙන්, මෙම සම්මත නියමයන් අදහස් වේ.

"**Straight2 Bankweb**" යන්නෙන් අපගේ අන්තර්ජාල මෙහෙයවීම අදහස් වේ.

"**පාලිත සමාගම**" යන්නෙන්, යම් සමාගමකට අදාළව,

(අ) මුලින් නම් සඳහන් කළ සමාගම විසින් ඍජුව හෝ වක්‍රව පාලනය කරනු ලබන,

(ආ) මුලින් නම් සඳහන් කළ සමාගම විසින් නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් අඩකට වැඩි ප්‍රමාණයක් සඳහා සෘජුව හෝ වක්‍රව ප්‍රතිලාභී හිමිකම් දරනු ලබන, හෝ

(ඇ) මුලින් නම් සඳහන් කළ සමාගමේ වෙනත් යම් පරිපාලිත සමාගමක පරිපාලිත සමාගමක් වන,

වෙනත් යම් සමාගමක් අදහස් වේ.

"**SWIFT පණිවුඩ**" යන්නෙන්, වර්ල්ඩ්වයිඩ් ඉන්ටර්බෑන්ක් ෆයිනෑන්ෂල් ටෙලිකමියුනිකේෂන් {Worldwide Interbank Financial Telecommunication (SCRL)} මඟින් සපයා ඇති පණිවුඩ සේවාවන් භාවිතයෙන් යවනු ලබන ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයන් (උපදෙස් අඩංගු විය හැකි) අදහස් වේ.

"**පද්ධති ද්‍රව්‍ය**" යන්නෙන්, සියලුම භාවිතා කරනු ලබන්නන්ගේ මාර්ගෝපදේශ, මෘදුකාංග, දෘඩාංග, ඉලෙක්ට්‍රොනික පිවිසුම්, කාඩ්පත් කියවීමේ යන්ත්‍ර, ඩිජිටල් සහතික සහ වෙනත් යම් උපකරණ, ද්‍රව්‍ය හෝ අප විසින් ඔබ වෙත ලබා දෙනු ලබන යම් මාධ්‍යක ලේඛනයක් අදහස් වේ.

"**බද්ද**" යන්නෙන්, නීතියට අනුව හෝ අප අධිකාරියක් අතර ඇතිකර ගත් කිසියම් එකඟතාවයකට අනුව හෝ අය කරනු ලබන යම් බද්දක්, ගාස්තුවක්, පැනවීමක්, තීරුබද්දක් හෝ වෙනත් යම් ගාස්තුවක් හෝ ඒ හා සමාන රඳවා තබා ගැනීමක් (ඒ හා සම්බන්ධ දඩ ගාස්තුවක් හෝ පොළියක් ඇතුළත්ව) අදහස් වේ.

"**ගනුදෙනුව**" යන්නෙන්,

(අ) පාර්ශ්වයන් අතර ඇති කරගත් යම් ගනුදෙනුවක්,

(ආ) ඔබගේ උපදෙස් මත අප විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ගනුදෙනුවක්, හෝ

(ඇ) ඔබ හා වෙනත් යම් පාර්ශ්වයන් අතර ඇතිකර ගනු ලබන යම් ගනුදෙනුවක් අදහස් වේ සහ **"ගනුදෙනු කිරීම"** යන්න ද මීට අනුරූපී තේරුමක් සහිත වේ.

"**ගනුදෙනු කිරීමේ නියමයන්**" යන්නෙන්, එක් එක් ගනුදෙනු කිරීම පාලනය කරනු ලබන නියමයන් අදහස් වේ.

"**පරිශීලකයා**" යන්නෙන්, ඔබ වෙනුවෙන් යම් සේවයක් භාවිත කිරීම සඳහා ඔබ විසින් බලය පවරනු ලබන යම් තැනැත්තෙකු අදහස් වේ.

"**පරිශීලක මගපෙන්වීම්**" යන්නෙන්, යම් ගිණුමක් හෝ සේවයක් සම්බන්ධයෙන් ඔබ වෙත ලබා දෙනු ලබන ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය පටිපාටික මාර්ගෝපදේශ, අත්පොත් හෝ තාක්ෂණික පිරිවිතරයක් අදහස් වේ.

"**පරිශීලකයාගේ හඳුනාගැනීමේ අංකය**" යන්නෙන්, පරිශීලකයකු වෙත වෙන් කරනු ලබන හෝ පරිශීලකයා විසින් තෝරා ගනු ලබන (රහස්‍ය අංකය, පුද්ගලික හැඳුනුම් අංකය, ඉලෙක්ට්‍රොනික යතුර හෝ ඒවායේ එකතුවන ආකාරයෙන් වන) යම් සුවිශේෂී හඳුනාගැනීමක් අදහස් වේ.

"**වෙබ් අඩවිය**" යන්නෙන්, අන්තර්ජාල වේදිකාව හෝ වෙබ්අඩවිය හරහා ඔබ ලබා දෙනු ලබන යම් සේවයක් අදහස් වේ.

"**අප**" "**අපගේ**" සහ "**අප විසින්**" යන්නෙන්, අදාළ ස්ථානයෙහි දී අදාළ සේවය(සේවා) සැපයුම්කරු වශයෙන් අදාළ ඉල්ලුම් පත්‍රයේ හඳුන්වා ඇති බැංකු සාමාජිකයා අදහස් වේ.

"**ඔබ**" "**ඔබගේ**" හා "**ඔබ විසින්**" යන්නෙන්, සේවය ලබා දෙනු ලබන ස්ථානයෙහි අදාළ සේවය ලබා ගන්නා සේවාදායකයා වශයෙන් අදාළ ඉල්ලුම් පත්‍රයේ හඳුන්වා ඇති තැනැත්තා අදහස් වේ.

1.2. <u>අර්ථනිරූපණය කිරීම පිළිබඳ රීති :</u>

(අ) **නිශ්චිත පොදු නියමයන් පිළිබඳව සඳහන් කිරීම** : මෙම සම්මත නියමයන් හි අන්‍යාකාරයෙන් සඳහන් කර ඇතොත් මිස :

(i) යම් තැනැත්තෙකු පිළිබඳව කරනු ලබන සඳහනකට එම තැනැත්තාගේ පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, අනුප්‍රාප්තිකයන්, ආදේශිතයන් (ගිවිසුමක් අලුත් කිරීම මගින් ඇතුළුව) සහ පැවරුම්ලාභීන් ඇතුළත් වේ.

(ii) යම් ලේඛනයක් පිළිබඳව සඳහන් කිරීමකට එහි යම් වෙනස් කිරීමක් හෝ ඒ වෙනුවට වෙනත් ලේඛනයක් ඉදිරිපත් කිරීමක් ඇතුළත් වේ.

(iii) "තැනැත්තා" යන්නෙන් යම් පුද්ගලයෙකු හවුල් හිමිකාරත්වයක්, සංස්ථාගත මණ්ඩලයක්, සංස්ථාගත නොකළ සංගමයක්, යම් ආණ්ඩුවක්, යම් රජයක්, යම් රජයක නියෝජිත ආයතනයක් සහ යම් භාරයක් ඇතුළත් වේ.

(iv) "නීතිය" යන වචනයට පොදු නීතිය, සාධාරණත්වය, පිළිබඳ මූලධර්ම හා පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීති ඇතුළත් වේ.

(v) යම් අධිකාරියක සහ ඕනෑම අර්ථකථනයක, යම්කිසි නීතියක් අදාළ කිරීමක හෝ බලාත්මක කිරීමක යම් නියෝගයක්, රීතියක්, නිල විධානයක්, ඉල්ලීමක් හෝ මාර්ගෝපදේශයක් (නීතියේ බලය තිබුණ ද නොතිබුණ ද) නීතිය පිළිබඳ සඳහන් කිරීමක් ඇතුළත් වේ.

(vi) නිදර්ශන ලැයිස්තුගත කිරීමේ දී "ඇතුළත් වේ" යන වචන සඳහන් කර ඇති විට එමඟින් එම නිර්දේශන හෝ ඊට සමාන ආකාරයේ නිර්දේශනවලට පමණක් සීමා නොවේ.

(vii) පුරුෂාර්ථයෙන් සඳහන් කර ඇති වචනවලට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වය ම ඇතුළත් වේ.

(viii) ඒක වචනයෙන් සඳහන් කර ඇති වචනවලට බහු වචන අර්ථය ද, එසේම බහු වචනයෙන් සඳහන් කර ඇති වචනවලට ඒක වචන අර්ථය ද ඇතුළත් වේ.

(ix) "ලිඛිත" යන්නෙන් අදහස් වන්නේ විද්‍යුත් තැපැල, ෆැක්ස් පණිවුඩ හෝ පැහැදිලිව කියවාගත හැකි ලෙස අප හට ලැබුණු අනෙකුත් විද්‍යුත් සන්නිවේදන ක්‍රම වන "ලියන ලද" යන්නට ද මීට අනුරූපී තේරුමක් ඇත.

(ආ) **ශීර්ෂ** :

මෙම නියමයන් හි ශීර්ෂයන් පහසුව සඳහා පමණක් වන අතර, ඒවායේ අර්ථ නිරූපණය සඳහා බලනොපායි.

## 2. <u>ඔබගේ වගකීම්</u>

### 2.1. <u>ඔබ විසින් පහත සඳහන් කරුණු පිළිපැදිය යුතුය :</u>

(අ) යම් සේවාවක් සහ යම් ආරක්ෂිත ක්‍රියාපටිපාටීන් සම්බන්ධයෙන් පරිශීලක මගපෙන්වීම් සහ අපගේ උපදෙස් අනුගමනය කළ යුතු ය;

(ආ) අදාළ සියලුම නීති අනුගමනය කළ යුතු ය;

(ඇ) නිවැරදි හා යාවත්කාලීන තොරතුරු, සාධාරණ වශයෙන් අප විසින් ඉල්ලා සිටිනු ලබන යම් තොරතුරු සහ ලේඛන (කිසියම් අධිකාරියක් හා අප යටතේ ඇති කිසියම් ගිවිසුමක් සම්බන්ධයෙන් අප විසින් සැපයීමට නියමිත ඔබේ පුද්ගලික තොරතුරු ද ඇතුළුව) ඔබ විසින් අප වෙත සැපයිය යුතු වන අතර, කිසියම් වෙනසක් සිදු වී ඇත්නම්, ඒ සම්බන්ධයෙන් අප වෙත වහාම දැනුම්දිය යුතු ය;

(ඈ) මෙම ගිවිසුමට අනුව, අප විසින් ඔබට දන්වා සිටින ආකාරයට, කිසියම් අධිකාරියකට ඔවුන්ගේ පුද්ගලික ආවේදනය සඳහා අපගේ රැස්කිරීම්, රඳවාගැනීම්, ගබඩා කිරීම්, භාවිතය, ක්‍රියාත්මක කිරීම්, මාරු කිරීම්, හෙළිදරව් කිරීම් සහ වාර්තා කිරීම් (ඍජුව හෝ වක්‍රව) සඳහා එකඟත්වය ලබා ගත යුතු ය;

(ඉ) සම්බාධක උල්ලංඝනය කිරීමෙහි ලා හෝ පරිසීමිත පාර්ශ්වයක ප්‍රතිලාභයක් සඳහා හෝ ඔබ හෝ පරිසීමිත පාර්ශ්වයක් වන වෙනත් සේවාදායක සමූහ සාමාජිකයකුට එරෙහිව ඍජුව හෝ වක්‍රව කිසියම් ක්‍රියාවක් පිළිබඳ දැන්වීමක්, විමර්ශනයක් හෝ ඒ සමාන ක්‍රියාවක් ඔබ හෝ කිසියම් සේවාදායක සමූහ සාමාජිකයකු හෝ ඍජුව හෝ වක්‍රව ඔබ හෝ වෙනත් සේවාදායක සමූහ සාමාජිකයකු හා සම්බන්ධ පුද්ගලයකු හෝ පරිසීමිත පාර්ශ්වයක් හෝ කිසියම් සම්බාධකයකට එරෙහි කිසියම් මාර්ගයක්, විමර්ශනයක් හෝ ඒ හා සමාන ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවට සහ ඒ සම්බන්ධ සේවාවක් හෝ ගනුදෙනුවක් සිදුකළ හෝ සිදුකිරීම පිණිස ඍජුව හෝ වක්‍රව භාවිත නොකරන බවට සහතික විය යුතු ය;

(ඊ) ඔබගේ පරිශීලකයන් සහ බලයලත් පුද්ගලයන්ට පමණක් පිවිසීමේ හැකියාව ඇති වන පරිදි, පද්ධති මෙවලම්, පරිගණක දත්ත පද්ධතීන්, පරිගණක දත්ත හඳුනාගැනීම්, පරිශීලක හඳුනාගැනීම් සහ සේවා සම්බන්ධ සියලු තොරතුරු ආරක්ෂිතව සහ රහසිගතව තබා ගත යුතු ය;

(උ) පද්ධති මෙවලම්, පරිගණක දත්ත පද්ධතීන්, පරිගණක දත්ත හඳුනාගැනීම්, පරිශීලක හඳුනාගැනීම්, තොරතුරු අස්ථානගතවී හෝ අයථා පරිදි භාවිතකොට ඇත්නම් හෝ එම තොරතුරු භාවිත කිරීමට බලය නොමැති යම් තැනැත්තෙකු විසින් ඒවා භාවිත කරයි නම් හෝ වහාම ඒ පිළිබඳව අප දැනුවත් කළ යුතු අතර, ආරක්ෂණ ක්‍රියාපටිපාටීන්ට අනුකූලවීමට අපොහොසත්කමක් හෝ කිසියම් මාර්ගගතයක් පිළිබඳ යම් සැක සහිත ගැටළුවක් පවතී නම් එවැනි යම් ගැටළුවක් විසඳාලීම සඳහා වූ අපගේ යම් සාධාරණ ඉල්ලීමක් සම්බන්ධයෙන් ඔබ විසින් සහය ලබාදීම පිණිස වහාම අප වෙත දැනුම් දිය යුතු ය;

(ඌ) ඔබගේ සහ අපගේ සේවාවන් තුළට අනවසර පිවිසීම් අනාවරණය කරගෙන, වැළැක්වීම සහ පාලනය කිරීමට සුදුසු හා ස්ථිරසාර ක්‍රියාවලියක් ක්‍රියාවට නංවා නඩත්තු කර, සේවාදායක පද්ධතීන්, පද්ධති ද්‍රව්‍ය හෝ මාර්ගගතන්ට අක්‍රමවත් උපාංග හඳුන්වාදීම් සම්බන්ධයෙන් සොයා දැන, වළකා, ඉවත්කර, පිළියම් යෙදීම සඳහා සියළුම යුක්ති සහගත පියවරයන් ගත යුතු ය; සහ

(එ) පරිශීලකයන් සහ බලයලත් පුද්ගලයන් ඔවුන්ට අදාළ පරිශීලක අංක හවුලේ භාවිත නොකරන බවට සහ අනාවරණය නොකරන බවට හා පොදු අන්තර්ජාල උපාංග පිවිසුමකින් හෝ ඔබට සහතික කළ නොහැකි, පොදුවේ භාවිත කරන පුද්ගලික පරිගණකයකින් සේවාවකට නොපිවිසෙන බවට සහතික විය යුතු ය;

(ඒ) ඕනෑම මාර්ගගතයක් භාවිත කිරීම සඳහා අවශ්‍ය දෘඩාංග, මෘදුකාංග සහ පද්ධතීන් ඔබ වෙත ඇති බවට සහතික විය යුතු ය; සහ

(ඔ) බැංකුව මගින් පාලනය නොවන ඕනෑම මාර්ගගතයක්, සේවාවක් හෝ පද්ධති ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීතිරීතිවලට අනුකූල විය යුතු ය.

2.2.

(අ) මූලික ආකෘතිපත්‍රයෙහි පරිශීලක වශයෙන් හඳුනාගත් යම් තැනැත්තෙකු වෙත සේවා ලබාගැනීම සහ ඔබ වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා බලය පවරා ඇති අතර, යම් වෙනසක් සිදු වූ විටක ඒ බව වහාම අප වෙත දැනුම්දෙන බව; සහ

(ආ) ඔබ විසින් සපයා ඇති හෝ ඔබට සම්බන්ධ තොරතුරු පොදු මාර්ගගතය(න්) යටතේ ඕනෑම සේවාදායක සමූහ සාමාජිකයකු වෙත අප විසින් හෙළිදරව් කරන බව;

ඔබ තහවුරු කරයි.

2.3. කිසියම් සේවාවකට පිවිසීම සඳහා හෝ ඉලෙක්ට්‍රොනිකව අප සමග සන්නිවේදනය කිරීමට හෝ උපදෙස් ලබාදීමට අප විසින් ඔබ වෙත සපයනු ලබන හෝ ඔබ විසින් භාවිත කරන හෝ යම් ඉලෙක්ට්‍රොනික සුචකයක්, සේවාදායක හඳුනාගැනීම, පරිශීලක හඳුනාගැනීම්, අංකන සහතික හෝ ජංගම උපාංග සම්බන්ධයෙන් වන වගකීම ඔබ විසින් දැරිය යුතු ය.

2.4. ඔබගේ ඉල්ලීමට අනුකූලවෙමින් අපගේ පද්ධති මෙවලම් වෙත ඔබගේ පරිශීලකගේ ප්‍රවේශය අත්හිටවූ අවස්ථාවක ස්වයංක්‍රීය ක්‍රියාවලීන් මගින් ඇතිවන සියලු ගනුදෙනු සඳහා ඔබ විසින් වගකීම් දැරිය යුතු ය.

3. <u>අපගේ වගකීම්</u>

3.1. <u>සේවා සැපයීමේ දී අප විසින්</u>

(අ) සාධාරණ රැකවරණයක් සහ කුසලතාවක් භාවිත කරනු ඇත;

(ආ) සේවාවන් සඳහා අවශ්‍ය වන්නේ නම්, අවලංගු කළ හැකි, හිමිකම් භාගය රහිත, අනන්‍ය නොවූ, පැවරිය නොහැකි මෘදුකාංග බලපත්‍රයක් ඔබ වෙත සපයනු ඇත;

(ඇ) ඔබ විසින් තෝරාගත්, දැනට බාධා ඇති හෝ භාවිත කළ නොහැකි ව ඇති, අපගේ පාලනයට යටත් ඕනෑම මාර්ගගතයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා යුක්ති සහගත ප්‍රයත්නයක් දැරීම හෝ අපට හැකි ඉක්මනින් විකල්ප පහසුකමක් ඔබ වෙත ලබාදීම සිදු කරනු ඇත;

(ඈ) ඔබේ වගකීම් යටතේ දක්වා ඇති කරුණු හැරෙන්නට, අප පාලනය කරන ඕනෑම මාර්ගගතයක් වෙත අනවසර පිවිසුම් වළක්වාලීම සඳහා ගත හැකි සියලුම සාධාරණ ක්‍රියාමාර්ග ගැනීම;

(ඉ) මූලික ආකෘතිපත්‍රය මගින් තෝරාගෙන ඇති ආකාරයට ඔබ වෙත වාර්තා එවනු ඇත. අදාළ අයදුම්පත්‍රයේ ලැයිස්තුගතකොට නොමැති ඕනෑම සේවාවක් සඳහා ඒවායේ ගනුදෙනු කොන්දේසි මත වාර්තා නිකුත් කෙරෙනු ඇත;

(ඊ) ඔබගේ ඉලෙක්ට්‍රොනික සූචකය, සේවාදායක හඳුනාගැනීම, පරිශීලක හඳුනාගැනීම් හෝ අංකන සහතික භාවිත කරන ඕනෑම තැනැත්තෙකු ඔබ විසින් එසේ කිරීමට බලය පවරන ලද තැනැත්තෙකු වශයෙන් පිළිගනු ඇත.

(උ) අප සමග ඇති කිසිදු ගිණුමක්, සේවාවක්, ගනුදෙනුවක් හෝ ගිවිසුමක් සම්බන්ධයෙන් ස්වාධීන නෛතික, අයබදු, ගිණුම්කරණ, ආරක්ෂණ සහ වෙනත් උපදෙස් ඔබ වෙත සැපයීමට අප වගකියනු නොලබන අතර, උපදේශක, විශ්වස්ත හෝ ඒ හා සමාන කර්තව්‍යයන් සම්බන්ධයෙන් අප, ඔබට ගැති නොවෙමු.

## 4. <u>උපදෙස්</u>

### 4.1. <u>මැන්ඩේටය ප්‍රතිස්ථාපනය කිරීම :</u>

ඔබගේ නව මැන්ඩේටයට අනුව අපගේ වාර්තා යාවත්කාලීන කිරීම සඳහා නව මැන්ඩේටය අප විසින් ලද අවස්ථාවේ සිට බැංකු වැඩකරන දින 7ක කාලයක් අපට අවශ්‍ය වේ. එතෙක් පවත්නා මැන්ඩේටය මත විශ්වාසය තබා අප විසින් ක්‍රියා කරනු ඇත.

### 4.2. <u>අසම්පූර්ණ සහ අනනුකූල උපදෙස් :</u>

ඔබගෙන් තොරතුරු විමසීමකින් තොරව, අසම්පූර්ණ හෝ අනනුකූල උපදෙස්, නිවැරදි හා පැහැදිලි කරගත හැකියැයි අප සාධාරණ ලෙස විශ්වාස කරන්නේ නම්, එම අසම්පූර්ණ හෝ අනනුකූල උපදෙස් මත අප ක්‍රියාකරනු ඇත.

### 4.3. <u>ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කිරීම:</u>

පහත සඳහන් අවස්ථාවන් හි දී අප විසින් ඔබගේ උදෙස් පිළිපදිනු නොලැබේ.

(අ) එම උපදෙස් ව්‍යාජ ඒවා බවට අප විසින් සලකනු ලබන අවස්ථාවක;

(ආ) ආරක්ෂිත ක්‍රියාදාමයන් උල්ලංඝනය කර ඇති බව විද්‍යමාන වන හෝ ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවක;

(ඇ) එසේ කිරීම සඳහා පිළිගත හැකි හේතු අප සතුව ඇති අවස්ථාවක: හෝ

(ඈ) ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අනවසර අයිරාවක් ඇතිවීම:

### 4.4. <u>ගෙවීම් උපදෙස් :</u>

ඔබගේ ගෙවීම් උපදෙස් යැවීමට ඔබ විසින් අප වෙත බලය පවරා ඇත. ඔවුන් වෙත ඔබ විසින් ඍජුව ම උපදෙස් යවා ඇති ලෙස සලකා, අප හෝ යම් බැංකු සාමාජිකයකු හෝ තෙවන පාර්ශ්වයක් එකී උපදෙස් මත කටයුතු කිරීමට ද ඔබ විසින් බලය පවරනු ලැබේ.

4.5. **<u>දැන්වීම</u> :**

ඔබගේ උපදෙස් පිළිපැදීමට නොහැකිවන අවස්ථාවක, හැකි ඉක්මනින් ම ඒ බව ඔබට දැනුම් දෙනු ඇත.

4.6. **<u>ගනුදෙනු අත්හිටුවීම :</u>**

ඔබ විසින් ඉල්ලා සිටින අවස්ථාවක අදාළ ගනුදෙනුව අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට අප විසින් ප්‍රයත්න දරනු ලබන අතර, එය එසේ කිරීමට නොහැකි වුවහොත් ඒ සම්බන්ධව වගකීම දරනු නොලැබේ.

5. **<u>දැන්වීම් සහ නිවේදන</u>**

5.1. **<u>දැන්වීම් සහ නිවේදන ස්වභාවය :</u>**

දැන්වීම් සහ නිවේදන පැහැදිලිව කියැවිය හැකි ඒවා විය යුතු අතර, අවසන් වරට දැනුම් දෙන ලද සම්බන්ධවීමේ තොරතුරු උපයෝගී කරගෙන, නියම කරන ලද අංශය වෙත යැවිය යුතු ය.

5.2. **<u>පහත සඳහන් කරුණු යටතේ ඔබ වෙත එවනු ලබන දැන්වීම් සහ නිවේදන සඵලදායී බවට සැලකිය හැකි ය.</u>**

අන්‍යාකාරයකින්, සඳහන්කොට නොමැති නම්, පහත සඳහන් මාධ්‍යන් හරහා එවනු ලබන අපගේ දැන්වීම් සහ නිවේදන සඵලදායී ලෙස සැලකිය හැකි ය.

(අ) අදාළ ෆැක්ස් පණිවුඩයේ එය සතුටුදායක ලෙස යවා ඇති බවට එහි වේලාව සඳහන් වන අවස්ථාවක;

(ආ) පෞද්ගලිව භාරදීමේ දී එය භාර දෙනු ලබන අවස්ථාවක;

(අ) තැපැලෙන් යැවීමේ දී තැපැල් කළ දිනට පසුව එළඹෙන බැංකු වැඩ කරන දින 5ක කාලය; සහ

(ඇ) අප විසින් දැනුම් දෙනු ලබන පරිදි, වෙනත් ඕනෑම මාර්ගගතයකින් යැවීමේ දී එය සඵලදායී කළ වේලාව.

5.3. **<u>අප වෙත එවනු ලබන දැන්වීම් සහ නිවේදන සඵලදායක වන අවස්ථා :</u>**

සත්‍ය වශයෙන් ම අප වෙත එම දැන්වීම් ලැබී ඇති විටෙක එය සඵලදායී ලෙස සැලකිය හැකිය.

5.4. **<u>වාචික හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් හරහා ලැබෙන උපදෙස් හා නිවේදන :</u>**

(අ) ඔබ විසින් දෙනු ලබන උපදෙස් හෝ නිවේදන අව්‍යාජ සහ සම්පූර්ණ ඒවා බව අපට හැඟී ගියහොත් වාචික හෝ ඕනෑම මාර්ගයක් හරහා අප වෙත ලැබෙන උපදෙස්

හෝ දැන්වීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකි ය. එවැනි උපදෙස් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට පෙරාතුව ඔබ විසින් එය සනාථ කළ යුතු ය.

(ආ) ඔබගේ උපදෙස් හෝ නිවේදන වාචික හෝ වෙනත් මාර්ගගතයක් හරහා එවීමේ දී ඒ සම්බන්ධයෙන් වන අවදානම ඔබ විසින් දැරිය යුතු ය.

**5.5. <u>දුරකථන සංවාද පටිගත කිරීම :</u>**

අදාළ ඕනෑම නීතියකට යටත්ව, ඔබ සමඟ පවත්වනු ලබන දුරකථන සංවාද අප විසින් පටිගත කරනු ලබන අතර, ගිවිසුම සම්බන්ධයෙන් වන ආරවුලක දී එසේ පටිගත කරන ලද සංවාද හෝ පටිගත කිරීම්වල ප්‍රතිලේඛන භාවිත කෙරෙනු ඇත.

**6. <u>අංකිත අත්සන් (Digital Signatures) සහ ඉලක්ට්‍රොනික ගිවිසුම්</u>**

**6.1. <u>අංකිත අත්සන :</u>**

අංකිත සහතිකයක් (Digital Certificate) හෝ ඉලෙක්ට්‍රොනික සූචකයක් සහිත ව එවා ඇති අංකිත අත්සන තැබූ උපදෙස් හා නිවේදන සඳහා ද ලිඛිත අත්සන තැබූ අයුරින් ම එකම නෛතික බලපෑම සහ වලංගු බව පවතී.

**6.2. <u>බලපවත්නා ඉලෙක්ට්‍රොනික ගිවිසුම් :</u>**

ඉලෙක්ට්‍රොනික වශයෙන් ක්‍රියාවට නංවන ලද ගිවිසුම් ඒ හා සම්බන්ධ සියලු නෛතික අවදානම් සහිතව බලපැවැත්වෙන බවට ඔබ සෑහීමකට පත්විය යුතු ය.

**6.3. <u>ජංගම උපකරණ (Mobile Devices) භාවිතය :</u>**

(අ) ජංගම උපකරණයක් හරහා Straight2Bank හි වාර්තා නැරඹීමට හෝ උපදෙස් ලබාදීමට ඔබගේ පරිශීලකයන් හෝ බලයලත් තැනැත්තන් හට අපගේ ජංගම බැංකුකරණ ක්‍රියාවලියේ දී අවසර ලැබේ.

(ආ) ජංගම උපකරණයක් හරහා ගනුදෙනුව සඳහා බලය ලබාදීමේ දී එසේ බලය පවරනු ලබන අවස්ථාවේ දී ඔබගේ බලයලත් තැනැත්තන්ට එම ගනුදෙනුවේ සම්පූර්ණ තොරතුරු දැක බලාගැනීමට අවස්ථාව නොලැබේ. ජංගම උපකරණ හරහා උපදෙස් ලබා දී බලය පවරනු ලැබීමේ දී ඇතිවන යම් අවදානමක් (සාපරාධී වංචා ඇතිවීමේ අවදානම ද ඇතුළුව) ඔබ විසින් දැරිය යුතු ය.

**6.4. <u>වෙබ් අඩවි :</u>**

(අ) අපගේ අන්තර්ජාල පද්ධති වෙත වඩාත් කාර්යක්ෂම ලෙස පිවිසීම සඳහා ඔබගේ පරිගණකයට තාවකාලික ගොනුවක් ලෙස "Cookies" නැමැති ගොනුව ඇතුළත් කළ

හැකි ය. එම ගොනුව ඔබට අවශ්‍ය අවස්ථාවේ දී මකා දැමිය හැකි ය. නමුත් එසේ කිරීමේ දී අපගේ සියලුම සේවාවන් සඳහා ඔබට ප්‍රවේශ විය නොහැකි ය.

(ආ) අපගේ වෙබ් අඩවි හා සම්බන්ධ සමහර සබඳතා අපගේ පාලනයෙන් තොර වෙබ් අඩවි හරහා ද පැතිරේ. එවැනි වෙබ් අඩවි සම්බන්ධයෙන් හෝ එහි අන්තර්ගතය සම්බන්ධයෙන් අප විසින් වගකීම් දරනු නොලැබේ.

(ඇ) අපගේ අනෙකුත් වෙබ් අඩවිවල මනා සබඳතාවයක් ලබා ගැනීම සඳහා එවැනි අනෙකුත් වෙබ් අඩවි සඳහා බලපාන කොන්දේසි අදාළ කරගත යුතු ය. එවැනි කොන්දේසි නොමැති නම්, මෙම ගිවිසුමෙහි කොන්දේසි බලපැවැත්වේ.

## 7. ඔබගේ බලයලත් තැනැත්තාගේ අධිකාරී බලය

### 7.1. බලයලත් තැනැත්තාගේ ක්‍රියාකාරකම් :

අන්‍යාකාරයකින් හැර ඔබ විසින් ලිඛිතව අප වෙත උපදෙස් ලබා දී ඇති අවස්ථාවක දී (සහ අප විසින් එවැනි උපදෙස් පිළිගෙන ඇති අවස්ථාවක දී) හැර පහත සඳහන් කරුණු ද ඇතුළුව උපදෙස් ලබාදීම, ඕනෑම ලේඛනයක් අත්සන් තැබීම සහ ඔබ වෙනුවෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීම සඳහා ඔබගේ බලයලත් තැනැත්තාට අධිකාරී බලය පවතී.

(අ) යම් සේවාවක් එකතු කිරීම හෝ ඉවත් කිරීම ඇතුළුව ගිවිසුමේ කොන්දේසි සඳහා එකඟවීම, අතිරේකයක් සැපයීම, නැවත ප්‍රකාශ කිරීම හෝ වෙනස් කිරීම; සහ

(ආ) සියලුම හෝ නිශ්චිත සේවාදායක කණ්ඩායම්වල සාමාජිකයන් වෙනුවෙන් නිර්මාණය කරන ලද පොදු මාධ්‍යයන් හි ඔබව ඇතුළත් කිරීම සඳහා අප වෙත උපදෙස් ලබාදීම සහ ඔබ වෙනුවෙන් (යම් අනුප්‍රාප්තිකයෙකු පත්කිරීම ඇතුළුව) නියෝජිතයෙකු වශයෙන් ඔබගේ යම් සාමාජිකයෙකු පත් කිරීම;

### 7.2. බලයලත් තැනැත්තාගේ අධිකාරී බලය අවසන් කිරීම :

අප වෙත ලිඛිතව දැනුම්දීමෙන් අනතුරුව බලය ලත් තැනැත්තාගේ අධිකාරී බලය අවසන් කිරීමට ඔබට හැකි ය.

## 8. මුදල්, වියදම් සහ ගිණුම හරකිරීම

### 8.1. මුදල් සහ වියදම් :

අඩුකිරීම් හෝ ප්‍රතිහිමිකම් පෑම හිලව්වට තැබීමකින් තොරව පහත සඳහන් ගෙවීම් අප වෙත ගෙවිය යුතු ය.

(අ) කිසියම් ගනුදෙනුවක් සඳහා හෝ අප විසින් දැනුම් දෙනු ලබන ආකාරයට, ගිවිසුම යටතේ ඔබ විසින් ගෙවිය යුතු ඕනෑම ගාස්තුවක් හෝ මුදලක්; සහ

(ආ) ගිවිසුම හෝ කිසියම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් අප විසින් දරනු ලබන යම් වියදමක් හෝ පාඩුවක්.

**8.2. මුදල් ආපසු ලබාගැනීම :**

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ගිවිසුම යටතේ හෝ කිසියම් ගනුදෙනුවක් සඳහා අප විසින් අය කරන ලද යම් ගෙවීමක් (ගෙවන ලද යම් පොළී මුදලක් ද ඇතුළුව) අවලංගු කිරීමට, ආපසු හැරවීමට හෝ හර කිරීමට අපට හැකියාව ඇත.

(අ) අත්වැරැද්දක් නිවැරදි කිරීම සම්බන්ධයෙන් අය කළ යම් මුදලක්;

(ආ) පූර්ණ වශයෙන් හෝ ක්ෂණිකව, නිශ්චිත හා කොන්දේසි විරහිත අරමුදල් අප වෙත ලැබී නොමැති අවස්ථාවක;

(ඇ) ගෙවනු ලබන පුද්ගලයා හෝ අණකරු වෙත අරමුදල් නැවත ලබාදීමට අපට අවශ්‍යව ඇති අවස්ථාවක; හෝ

(ඈ) එසේ කිරීමට සාධාරණ හේතුන් අපට ඇති අවස්ථාවක.

**8.3. ඔබගේ ගිණුම්වලට හර කිරීම :**

(අ) ඔබ විසින් අප සමග පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙතින් ගිවිසුම යටතේ හෝ කිසියම් ගනුදෙනුවක් සඳහා අයවිය යුතු හෝ ගෙවීමට නියමිත යම් මුදලක් ඕනෑම අවස්ථාවක අප විසින් හර කිරීම; සහ

(ආ) අප විසින් සාධාරණ වශයෙන් තීරණය කරනු ලබන අනුපාතයක් මත, ගිවිසුම යටතේ හෝ ඕනෑම ගනුදෙනුවක් සඳහා ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් වූ පොළිය එය ගෙවිය යුතුව තිබූ දින සිට එය සත්‍ය වශයෙන් ගෙවිය යුතු දිනය දක්වා අය කිරීම කරනු ලැබිය හැකිය.

**9. මූල්‍ය ආයතන සමඟ ඇති කරගත් සැකසුම්**

**9.1.** මූල්‍ය ආයතනයක් හෝ බැංකු සාමාජිකයකු සමඟ ගාස්තු සහ තොරතුරු බෙදාගැනීම් සැකසුම් කිරීමේ ක්‍රමවේදයකට ඇතුළත්වීමේ හැකියාව අපට ඇත. එවැනි පුද්ගලයන් වෙත අප විසින් ඔබ පිළිබඳ තොරතුරු හෙළිදරව් කරනු ඇත. ඔබ ඉල්ලා සිටියහොත්, එවැනි සැකසුම් පිළිබඳ තොරතුරු අප විසින් ඔබ වෙත ලබා දෙනු ඇත.

**10. හානිපූරණය හා වගකීම් සීමා කිරීම**

**10.1. (අ) වගකීම සම්බන්ධ පොදු බැහැර කිරීම :**

ඔබට සිදුවන හෝ ඔබ විසින් දරනු ලබන පහත සඳහන් පාඩු

i. යම් සේවාවක්, මාර්ගගතයක්, පද්ධති ද්‍රව්‍ය හෝ ගනුදෙනු;

ii. අපගේ පාර්ශ්වය වෙතින් සිදුවන ක්‍රියාවක් හෝ පැහැරහැරීමක්;

iii. හදිසි තත්ත්වයන් හේතුවෙන් ඇති වන යම් පාඩුවක්.

කොන්ත්‍රාත්තුව උල්ලංඝනය කිරීම, ව්‍යවස්ථාව හෝ අන්‍යාකාරයකින් පැන නගින පාඩු සම්බන්ධයෙන් වන වගකීම අප විසින් දරනු නොලැබේ. අප පාර්ශ්වය මගින්

සිදුවන යම් වංචාවක්, පූර්ණ වශයෙන් නොසැලකිල්ල හෝ සිතාමතා සිදුකරන විෂමාචාර හේතුවෙන් සිදුවන සෘජු අලාභ සඳහා වන වගකීම අප විසින් දරන අතර, වක්‍රව හෝ ආනුෂංගික පාඩු හෝ ලාභ නොමැතිවීම වැනි කලින් දැනගත හැකි හෝ සිදුවිය හැකි පාඩු සම්බන්ධයෙන් වන වගකීම අප විසින් දරනු නොලැබේ.

(ආ) **මූල්‍යමය සීමාවන් :** මාර්ගගතයක් හරහා පිවිසෙන සේවා සම්බන්ධයෙන්, කිසියම් මාර්ගගතයක සිදු වූ කිසියම් අපොහොසත්කමක් හෝ බාධාවක් හේතුවෙන් පැන නැගුන යම් පාඩුවක් සඳහා යම් හිමිකම්පෑමක් සම්බන්ධයෙන් වන මුලු වගකීම, අප විසින් දරනු ලබන අතර, එහි මුළු එකතුව කැලැන්ඩර් වර්ෂයක දී එම අලාභය සිදු වූ දිනට දින 90ක ට පෙර මෙහෙයුම් සේවා ගාස්තු වශයෙන් ඔබ විසින් ගෙවන ලද මුදල හෝ ඇ.ඩො. 100,000ක මුදල යන දෙකෙන් ඉහළ ගාස්තුව ඉක්මවිය යුතු නොවේ.

10.2. **<u>ඔබගේ හානිපූරණය :</u>**

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පැන නගින හෝ දරන ලද යම් පාඩුවක් ඉල්ලා සිටීමේ දී ඔබ විසින් හානිපූරණය කරනු ලැබේ.

(අ) අප විසින් ඔබ වෙත යම් සේවාවක් සැපයීමේ දී පාඩු සිදුවීම;

(ආ) ඔබ හෝ ඔබගේ බලයලත් තැනැත්තෙකු ගිවිසුම යටතේ වන යම් බැඳීමකට අනුකූල නොවීම;

(ඇ) ඔබගේ උපදෙස් මත ක්‍රියාකිරීම හෝ ක්‍රියා කිරීමට අපොහොසත්වීම;

(ඈ) යම් සුරැකුමක් තබාගැනීම හෝ යම් සහතික වත්කමක් සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඉ) ගිවිසුමට අනුව අප විසින් මුදල් වර්ග අනුවර්තනය කිරීම; සහ

(ඊ) කිසියම් බදු මුදලක් සඳහා අප වෙත ගෙවිය යුතු, හෝ ගිවිසුම (අප විසින් ලබන ලද හෝ ලැබිය යුතු වන අපගේ ශුද්ධ ආදායම සම්බන්ධයෙන් අප විසින් ගෙවිය යුතු බදු මුදල් හැර) යටතේ ඔබ විසින් හෝ ඔබ වෙත ගෙවන ලද හෝ ගෙවිය යුතු කිසියම් මුදලක් සම්බන්ධයෙන් ගණනය කිරීම.

ගිවිසුම යටතේ ඔබගේ අනෙකුත් බැඳීම් සම්බන්ධයෙන් මෙම හානිපූරණ ස්වාධීන වන අතර, එකී ගිවිසුම අවසන්වීමෙන් පසුව ද එය අඛණ්ඩව පවතී.

10.3. **<u>අනෙකුත් වගකීම් සීමාවන් :</u>**

යම් සේවා අතිරේකයක අඩංගුව ඇති වෙනත් යම් වගකීම් සිමාවන් ඊට අමතර වන අතර, ඒ මඟින් මෙම වගන්තිය සීමා නොවන්නේ ය.

**10.4. තුන්වන පාර්ශ්ව වෙත යැවිය යුතු ලේඛන :**

තුන්වන පාර්ශ්ව වෙත යැවීම සඳහා ඔබ විසින් අප වෙත සපයනු ලබන ලේඛන හෝ දත්ත සම්බන්ධයෙන් අප කිසිදු වගකීමක් නොදරන බව දන්වන අතර, අදාළ වගකීම ඔබ විසින් දැරිය යුතුය. එම ලේඛන ඔවුන් වෙත යැවීමට පෙර ඒවා සමාලෝචනය කිරීම අප සතු වගකීමක් නොවේ.

**10.5. අප වෙත කරනු ලබන දැනුම්දීම් :**

ඔබ විසින් අප වෙත ඉදිරිපත් කරනු ලබන යම් හිමිකම්පෑමක් සම්බන්ධයෙන් වූ වැදගත් කරුණු ඔබ ඒ පිළිබඳව දැනුවත්වීමෙන් මාස 06ක කාලයක් ඇතුළත ලිඛිතව අප වෙත දැනුම් දිය යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, ඔබගේ හිමිකම්පෑමේ සියලුම අයිතීන් ඔබ විසින් අත්හැර දමනු ඇත.

**11. තොරතුරු අනාවරණය කිරීම**

11.1. පහත සඳහන් අවස්ථාවන් හි හැර, ඔබගේ පුද්ගලික තොරතුරු ද ඇතුළුව, ඔබ සම්බන්ධයෙන් අදාළවන තොරතුරු හෝ ඔබ විසින් සපයනු ලබන තොරතුරුවල රහස්‍යතාව අප විසින් සුරකිනු ඇත.

(අ) යම් බැංකු සාමාජිකයෙකු වෙත තොරතුරු හෙළිදරව් කිරීම.

(ආ) හෙළිදරව් කරන තැනැත්තා වෙත රහස්‍යතාවය සුරැකීමේ වගකීමට යටත් ව යම් බැංකු සාමාජිකයෙකුගේ සේවා සපයන්නෙකු, රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කරුවකු හෝ වෘත්තීය උපදේශකයෙකු වෙත තොරතුරු හෙළිදරව් කිරීම.

(ඇ) පාර්ශ්වකරුවන් අතර (හෝ එහි යම් නියෝජිතයෙකු හෝ වෘත්තීය උපදේශකයෙකු) ඇති වන යම් ගනුදෙනු යටතේ අපගේ අයිතීන් හෝ බැඳීම් සම්බන්ධ යම් සැබෑ හෝ විභව්‍ය සහභාගිවන්නෙකු, උප-සහභාගිවන්නකු හෝ පැවරුම්ලාභියෙකු වෙත තොරතුරු හෙළිදරව් කිරීම.

(ඈ) යම් තක්සේරු ආයතන, හෝ සෘජු හෝ වක්‍ර ණය ආරක්ෂණ සැපයුම්කරුවන් වෙත තොරතුරු හෙළිදරව් කිරීම.

ඉහත සඳහන් අප, ඕනෑම බැංකු සාමාජිකයකු හෝ තෙවන පාර්ශ්වයක් නීතියට හෝ ඕනෑම අධිකාරියකට හෝ අප සහ වෙනත් ඕනෑම අධිකාරියක් අතර ඇති කරගත් ගිවිසුමකට අනුව, අවශ්‍ය වන පරිදි එවැනි ඕනෑම තොරතුරක් මාරුකිරීම හෝ අනාවරණය කිරීම සිදු කරනු ඇත.

12. **<u>ගනුදෙනු</u>**

12.1. **<u>ඔබට ගනුදෙනු කළ නොහැකි බව</u>**

අපගේ අනුමැතියකින් තොරව ගිවිසුම යටතේ පවතින ඔබගේ අයිතීන් හෝ බැඳීම් පැවරීම, අළුත්කිරීම, මාරුකිරීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම නොකළ යුතු ය.

12.2. **<u>අප විසින් සිදු කරන ගනුදෙනු</u>**

යම් තැනැත්තෙකුගේ අනුමැතියකින් තොරව ගිවිසුම යටතේ පවතින අපගේ සියලුම හෝ යම් අයිතීන් සහ/හෝ බැඳීම් පැවරීම, අළුත්කිරීම, මාරුකිරීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු සිදු කිරීම කළ හැකිය. ඔබගේ කැමැත්ත ලබාදීම සහ ලේඛන අත්සන් තැබීම ඇතුළු අපගේ සාධාරණ ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ අනුකූලතාවය දැක්විය යුතු ය.

13. **<u>හිලව් කිරීම</u>**

13.1. ගිවිසුම යටතේ හෝ අප සමග පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක් යටතේ ඔබට හෝ ඔබගේ යම් සාමාජිකයෙකු වෙත අප විසින් හෝ අපගේ සාමාජිකයකු වෙතින් (ගෙවීම සඳහා නියමිත වුව ද එසේ නොමැති වුව ද) අය විය යුතු ඕනෑම මුදල් ප්‍රමාණයක් අප විසින් හිලව් කරනු ලැබේ. (අප විසින් ඔබ වෙත සිදුකරන ඕනෑම මුදලක් සම්බන්ධයෙන් ගෙවන දිනය සහ විනිමය හුවමාරු ඇතුළුව) මෙම වගන්තිය යටතේ අප විසින් හිලව් කිරීම සිදුකිරීම සඳහා ඕනෑම දෙයක් සිදුකරනු ලැබේ.

14. **<u>මුදල් අනුවර්තනය</u>**

14.1. ඔබ වෙතින් අප වෙත ලැබෙන හෝ අප වෙතින් ඔබ වෙත අයවිය යුතුව ඇති හෝ ඔබගේ උපදෙස් අනුව පැන නැගී ඇති යම් මුදලක් සම්බන්ධයෙන් අපගේ පවත්නා අදාළ වන විනිමය අනුපාතයට අනුව, අප විසින් මුදල් අනුවර්තන සිදුකරනු ඇත. එවැනි අනුවර්තන සඳහා අපගේ සාමාන්‍ය ගාස්තු ඔබ විසින් ගෙවිය යුතු ව ඇත.

15. **<u>බදු</u>**

15.1. අප වෙත සිදුකරනු ලබන ගෙවීමක් මත බදු අයකර ගැනීමට ඔබට අවශ්‍ය වන විට ගෙවිය යුතු මුදල ඔබ විසින් වැඩි කළ යුතු ය. එවිට යම් අඩුකිරීමක් සිදුකිරීමට අවශ්‍ය නොවූ විටෙක මෙන් අප වෙත ලැබිය මුදල ම අපට ලැබෙනු ඇත.

15.2. ඔබ වෙත සිදු කරනු ලබන කිසියම් ගෙවීමකින් කිසියම් බදු මුදලක් අප විසින් අඩු කළ යුතු වන්නේ නම්, ගෙවිය යුතු මුදල වැඩි කිරීම අප විසින් සිදු කිරීම අවශ්‍ය නොවන අතර, එබැවින් අඩුකිරීමක් අවශ්‍ය නොවුවහොත් ඔබ විසින් ලබනු ඇති මුදල ම ඔබ විසින් ලබනු ඇත. බදු සඳහා මුදල් අඩුකිරීමට, අදාළ නීතිවලට හෝ ගිවිසුමට අනුකූලව අදාළ අධිකාරිය

වෙත බදු ගෙවීමට සහ අනෙක් පාර්ශ්වය වෙත ලදුපතෙහි මුල්පිටපත ලබාදීමට එක් එක් පාර්ශ්වය එකඟ වේ.

## 16. <u>අවසන් කිරීම සහ අත්හිටුවීම</u>

### 16.1. <u>එක් පාර්ශ්වයක් විසින් අවසන් කිරීම :</u>

එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත දින 30ක පූර්ව ලිඛිත අනුමැතිය ලබාදීම මඟින් සේවාවක හෝ ගිවිසුමේ යම් කොටසක් හෝ එම ගිවිසුම හෝ සේවාව පූර්ණ වශයෙන් අවසන් කළ හැකි ය.

### 16.2. <u>අප විසින් අවසන් කිරීම :</u>

පහත සඳහන් අවස්ථාවන් හි දී පූර්ව දැනුම් දීමකින් තොරව යම් ගනුදෙනුවක, සේවාවක හෝ ගිවිසුමේ යම් කොටසක් හෝ ගිවිසුම හෝ සේවාව සම්පූර්ණයෙන් ම වහාම අවසන් කළ හැකි ය.

(අ) පාර්ශ්වකරුවන් අතර ඇති කරගත් ගිවිසුමේ හෝ වෙනත් යම් ගිවිසුමක යම් කොන්දේසියක් ඔබ විසින් උල්ලංඝනය කරනු ලබන අවස්ථාවක දී;

(ආ) ඔබගේ සියලුම ආදායම් හෝ වත්කම් හෝ යම් කොටසක් වස්තුභංගත්ව නීති කෘත්‍යයකට යටත්කොට ඇති අවස්ථාවක දී;

(ඇ) ඔබ හෝ අප විසින් ගිවිසුම යටතේ අපගේ අදාළ බැඳීම් ඉටුකිරීම නීති විරෝධීවීම හෝ නීතිවිරෝධී විය හැකි අවස්ථාවක දී;

(ඈ) ගිවිසුමට අනුකූලවීම මඟින් නියාමන අවශ්‍යතාවක් උල්ලංඝනය කිරීම හෝ යම් අදාළ නියෝගයක් ආශ්‍රිත අපගේ ප්‍රතිපත්තියක් උල්ලංඝනය කිරීම හෝ අප සහ කිසියම් අධිකාරියක් අතර ගිවිසුමක් හෝ කිසියම් අධිකාරියක් වෙත අපගේ ප්‍රතිපත්ති හා බැඳුණු කිසියම් අදාළ නීතියක් හෝ නියෝගයක් හෝ සම්බාධකයක් අප විසින් උල්ලංඝනය කිරීමට හේතු විය හැකි අවස්ථාවක දී; හෝ,

(ඉ) සේවාව සම්බන්ධයෙන් ඔබට යම් බලපෑමක් ඇති වන අවස්ථාවක දී හෝ අප විසින් සාධාරණ ලෙස සලකනු ලබන යම් විශේෂිත සිද්ධියක් සිදුවී ඇති අවස්ථාවක දී.

### 16.3. <u>අපගේ සේවා අත්හිටුවීම :</u>

ඕනෑම අවස්ථාවක අපගේ ගනුදෙනු සහ/හෝ සේවා අත්හිටුවිය හැකි ය. අප එවැනි ක්‍රියාවක් සිදු කළ වහාම, ප්‍රායෝගිකව හැකි අයුරින් ඒ බව ඔබට දැනුම් දෙනු ලැබේ.

### 16.4. <u>සේවා අත්හිටුවන ලෙස ඔබ විසින් කරනු ලබන ඉල්ලීම් :</u>

ඔබගේ ලිඛිත ඉල්ලීමක් මත යම් සේවාවක් පූර්ණ වශයෙන් හෝ එහි යම් කොටසක් අප විසින් අත්හිටුවනු ලැබේ.

16.5. **සේවා අත්හිටුවීම හෝ අවසන් කිරීමට පෙර කරනු ලබන උපදෙස් ඃ**

සේවය අවසන් කරන හෝ අත්හිටුවනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව දෙන ලද කිසියම් උපදෙසක් හෝ සිදුකරන ලද යම් ගනුදෙනුවක්, යම් තැනැත්තකු අන්‍යාකාරයෙන් එකඟ වී ඇත්නම් මිස ඒ තැනැත්තාට උපචිතවන අයිතිවාසිකම් සහ වගකීම් කෙරෙහි බලනොපෑ යුතු ය.

16.6. **තවදුරටත් බලපවත්වන විධි විධාන ඃ**

මුදල්, ආපසු ලබාගැනීම්, හානිපූරණ, වගකීම් සීමා කිරීම, තොරතුරු අනාවරණය, හිලව්කිරීම, මුදල් පරිවර්තනය, බදු, ප්‍රතිලාභ හෝ ද්‍රව්‍යමය හානි, පාලන නීතිය සහ අධිකරණ බලය සම්බන්ධ විධිවිධාන සහ "පොදු" ශීර්ෂය යටතේ දක්වා ඇති විධිවිධාන යම් ගිවිසුමක් අවසන් කිරීමේ දී තවදුරටත් බලපැවැත්විය යුතු ය.

16.7. **හදිසි තත්ත්වයක් නිසා ගිවිසුම සපුරාලිය නොහැකිවීම ඃ**

හදිසි තත්ත්වයක් නිසා ඇතිවන සිද්ධීන් අවසන් වන තුරු යම් සේවාවක් සැපයීම අත්හිටුවීම අප විසින් සිදු කළ හැකි ය.

16.8. **ලබා දී ඇති අයිතමයන් ආපසු භාරදීම හෝ විනාශ කිරීම ඃ**

ගිවිසුම අවසන් කිරීම හෝ ගිණුම වසා දැමීමෙන් අනතුරුව ඔබ විසින් පහත සඳහන් කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය.

(අ) අප විසින් ඔබ වෙත සපයන ලද සේවා සම්බන්ධයෙන් වූ යම් අයිතමයක් ආපසු භාරදිය යුතු ය.

(ආ) සේවාව අත්හිටුවීම හෝ ගිණුම වසාදැමීම සම්බන්ධයෙන් අප විසින් දෙනු ලබන සාධාරණ උපදෙස් වහාම අනුගමනය කර, එය සිදු කළ බව ලිඛිතව අප වෙත සහතික කර, අප විසින් සාධාරණ වශයෙන් ඉල්ලුම් කරන ඕනෑම ලේඛනයක් අත්සන් කර අප වෙත භාර දිය යුතු ය.

17. **හවුල් ව්‍යාපාර**

17.1. **වගකීම් ඃ**

හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් වන විට, සියලුම හවුල්කරුවන් (ඒකාබද්ධ ව සහ වෙන් වෙන් ව යන පදනම මත) ගිවිසුම මගින් බැඳීම්වලට යටත් වන අතර, ඔබගේ හවුල් ව්‍යාපාරයේ යම් වෙනස්කම් හෝ ව්‍යාපාර නාමයේ වෙනසක් හෝ එසේ නැතහොත් විසුරුවා හැරීමක් සිදු කළ වුවද ඔබ වෙතින් අපට අයවිය යුතු සියලුම ණය සහ අනෙකුත් වගකීම් ගෙවා පියවීමට සියලු හවුල්කරුවන් මෙම ගිවිසුමට අනුව බැඳී සිටී.

**17.2. පාර්ශ්වකරුවෙකු වීම අවසන්වීම :**

යම් තැනැත්තෙකු පාර්ශ්වකරුවකු වීම අවසන්වන දිනය ඇතුළුව, ඒ දක්වා අප වෙත ලැබිය යුතු සියලු ණය සහ වගකීම් එම තැනැත්තා ඕනෑම හේතුවක් නිසා පාර්ශ්වකරුවකු වීම නැවතුන ද අඛණ්ඩව පවතින්නේ ය.

**17.3. ඉදිරියට පවතින ගනුදෙනු :**

ඔබ විසින් අපට ලිඛිතව දැනුම් දුනහොත් මිස, දැනට සිටින හෝ නව හවුල්කරුවන් ඔබ වෙනුවෙන් ක්‍රියා කිරීමට සම්පූර්ණ බලය ඇති තැනැත්තන් ලෙස අප විසින් සලකනු ලැබේ.

**17.4. වෙනස්වීම් පිළිබඳ දැනුම්දීම :**

ඔබගේ හවුල්කරුවන්ගෙන් ඇති විය හැකි යම් වෙනස්කමක් හෝ නමෙහි ඇතිවන යම් වෙනස්කමක් නොපමාව ලිඛිතව අප වෙත දැනුම් දිය යුතු ය.

**18. පාලනය වන නීතිය හා අධිකරණ බලය**

**18.1. පාලනය වන නීතිය :**

(අ) ගිණුම් විවෘත කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශ්ව අතර ගිවිසුම්ගත සම්බන්ධතාවන් ගිණුම පවත්වාගෙන යනු ලබන සේවා මධ්‍යස්ථානයේ නීති මඟින් පාලනය වන්නේ ය.

(ආ) (ගිණුම් පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන සේවා හැර) එක් සේවා මධ්‍යස්ථානයක් මඟින් සේවාදායක කණ්ඩායමකට සපයනු ලබන සේවාවන් එකී සේවා ස්ථානයේ නීති මඟින් පාලනය වන්නේ ය.

(ඇ) (ගිණුම් පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන සේවා හැර) එක් සේවා මධ්‍යස්ථානයකට වඩා වැඩියෙන් සේවාදායක කණ්ඩායම් සාමාජිකයන් වෙත සේවා සැපයීම එංගලන්ත නීතිය යටතේ පාලනය වන අතර, මෙය දෙවන සේවා මධ්‍යස්ථානයේ සේවාවන් ලබා දුන් මොහොතේ හෝ ලබාදීමට යන මොහොතේ පටන් බලපැවැත්වෙන අතර, කෙසේ නමුත් අතීතයට බලනොපාන අතර, සේවා ස්ථාන ගණන එකකට අඩුවන අවස්ථාවේ දී පවා මෙය අදාළ වේ.

**18.2. අධිකරණ බලය :**

(අ) පාලන නීතිය අදාළ වන ස්වකීය අධිකරණ බලය හිමි අධිකරණය වෙත පාර්ශ්වකරුවන් විසින් නීති කෘත්‍ය ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඉහත (අ) උප-පරිච්ඡේදය යටතේ සඳහන් කරනු ලැබූ අපගේ අයිතිවාසිකම්වලට අමතරව, ඔබ ව්‍යාපාර හෝ වත්කම් පවත්වාගෙන යනු ලබන යම් අධිකරණ කලාපයක් තුළ දී අප විසින් යම් බලාත්මක කිරීමේ පියවර ගනු ලැබිය හැකි ය.

**18.3. මුක්තිය අත්හැරීම :**

නඩු තීන්දුවක් හෝ නඩු තීන්දුවක් ක්‍රියාත්මක කිරීමට පෙර හෝ පසුව යම් නීති කෘත්‍ය, හෝ යම් සම්බන්ධතාවයක් සම්බන්ධව යම් අධිකරණ බලයක් පිළිබඳ යම් නිදහස් අයිතියක් හෝ වෙනත් යම් මුක්තියක් ඔබ විසින් වෙනස්කළ නොහැකි ලෙස අත්හරිනු ලැබේ.

**19. සැකසුම් නියෝජිතයා**

**19.1. නියෝජිතයෙකු පත් කිරීම :**

අප විසින් ඉල්ලීමක් කරනු ලැබුවහොත්, ගිවිසුම හා සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග සම්බන්ධ යම් ලියවිල්ලක් ලැබීම සඳහා ඔබගේ නියෝජිතයා වශයෙන් සැකසුම් නියෝජිතයෙකු නැවත අවලංගු කළ නොහැකි ලෙස පත්කර, එම නියෝජිතයාගේ නම හා ලිපිනය අප වෙත දැනුම් දිය යුතු ය. එසේ බැංකු දින 07ක් ඇතුළත නියෝජිතයෙකු පත්කිරීමට ඔබ අපොහොසත් වුවහොත්, ඔබ වෙනුවෙන් සැකසුම් නියෝජිතයකු අප විසින් පත්කොට ඒ පිළිබඳ දැනුම් දෙනු ලැබේ.

**19.2. නියෝජිතවරයකු ප්‍රතිස්ථාපනය කිරීම :**

එම පුද්ගලයා එකී අරමුණක් වෙනුවෙන් තව දුරටත් ඔබේ නියෝජිතවරයකු නොවේ නම්, ප්‍රතියෝජන නියෝජිතවරයකු වහාම නැවත පත් කළ යුතු අතර, එකී නියෝජිතයාගේ නම සහ ලිපිනය අප වෙත දැනුම්දිය යුතු ය. එසේ අලුත් නියෝජිතයකු පත්කිරීමට ඔබ අපොහොසත් වුවහොත් අප විසින් අලුත් නියෝජිතයකු පත්කරනු ලැබේ. එම ප්‍රතියෝජන නියෝජිතයාගේ නම සහ ලිපිනය අප විසින් ඔබට දැනුම් දෙනු ලැබේ.

**20. සාමාන්‍ය කරුණු**

**20.1. අපගේ නියෝජිතයන් :**

අපගේ බැඳීම් හෝ සේවා ඉටුකිරීම සඳහා අප විසින් (සම්බන්ධීකාරකයන් ද ඇතුළුව) ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් සහ නියෝජිතයන් පත්කරනු ලැබිය හැකි ය.

**20.2. සේවා මට්ටම් ගිවිසුම :**

අන්‍යාකාරයකින් එකඟවී ඇත්නම් මිස, සේවා මට්ටම් ගිවිසුමට කිසිම නෛතික බලපෑමක් නොමැත.

**20.3. බුද්ධිමය දේපල අයිතිය :**

පද්ධති ද්‍රව්‍යවල හෝ ඕනෑම වෙබ් අඩවියක් සම්බන්ධ බුද්ධිමය දේපල අයිතිය අප සතුවන අතර, හෝ අප ගිවිසුමකට එළඹ ඇති ඕනෑම බලපත්‍රලාභියකු හෝ වෙනත් පුද්ගලයකු සතු ව ඇත. වෙනස් කිරීම, සම්පාදනයෙන් ඉවත් කිරීම, ආපසු හැරවීම, හෝ පිටපත් සැකසීම හෝ

කිසියම් මෘදුකාංගයක් ව්‍යුත්පන්න කිරීම හෝ කිසියම් පද්ධති ද්‍රව්‍යයකට හෝ එහි ගබඩා කර ඇති තොරතුරුවලට බලපෑම් ඇති කිරීම, හෝ මාරු කිරීම, හවුලේ බෙදාගැනීම හෝ මෘදුකාංග හෝ පද්ධති ද්‍රව්‍ය උප-බලපත්‍ර කිරීම හෝ අපගේ පූර්ව-ලිඛිත අනුමැතියකින් තොරව ඒවා පිටපත් කිරීම ඔබ විසින් නොකළ යුතු වේ.

20.4. **<u>උල්ලංඝනය නොකිරීම</u> :**

අපගේ සාධාරණ මතය අනුව අපගේ යම් නීතියක් අදාළවීම හෝ යම් ප්‍රතිපත්තියක් හෝ නීතියක් අදාළවීම හෝ යම් අධිකාරියක නියමයක් හෝ අවසරයක් උල්ලංඝනයවීමක් සංයුක්ත වේ නම් මිස මෙම ගිවිසුමේ කිසිවක් මඟින් කිසිවක් සිදුකිරීමට හෝ සිදුකිරීමෙන් බැහැරවීමට අප වෙත බැඳීමක් ඇතිකරනු නොලබයි.

20.5. **<u>බැහැර කිරීම්</u> :**

ගිවිසුමෙහි සවිස්තරව දක්වා නොමැති නම්, සේවාවන් හා පද්ධති ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගුණත්වය, ලබාදීමට ඇති හැකියාව, ආරක්ෂණය සහ යෝග්‍යතාවය ද ඇතුළුව නමුත් එයට සීමා නොවී අදාළ නීති මඟින් අවසර දී ඇති විස්තාරය හැර, නීතිය මඟින් අදහස් කර ඇති සියලු නීතිරීති, කොන්දේසි සහ වගකීම් සවිස්තරව දක්වා ඇති ප්‍රකාරව සේවාවන් සහ පද්ධති ද්‍රව්‍ය 'ඇති සැටියෙන්' සහ 'ලබාදිය හැකි සැටියෙන්' යන පදනම මත සපයනු ලබයි.

20.6. **<u>බැංකු දිනය</u> :**

යම් සේවා මධ්‍යස්ථානයක දී යම් උපදෙසක් අනුව අප විසින් ක්‍රියාකරනුයේ හෝ යම් සේවාවක් සපයනු ලබනුයේ බැංකු දිනවල දී පමණි.

20.7. **<u>වාර්තා සහ සහතික පත්‍ර සහ වෙනත් තොරතුරු තීරණාත්මක විය යුතු බව</u> :**

ඔබගේ උපදෙස් හෝ වාර්තා, සහතිකපත්‍ර සහ වෙනත් තොරතුරු සම්බන්ධයෙන් ඔබ වෙත සපයනු ලබන අපගේ සියලු වාර්තා අපගේ වාර්තා මත පදනම් වන අතර, පැහැදිලි දෝෂයක් නොමැති විට ඒවා තීරණාත්මක ය. පැහැදිලි දෝෂයක් නොමැති විටක අප විසින් දැනුම් දෙනු ලබන ආකාරයට ඔබ වෙත හෝ ඔබ විසින් ගෙවිය යුතු වන අනුප්‍රමාණ මිළ ගණන් හෝ යම් මුදලක් තීරණාත්මක ලෙස සලකනු ලැබිය යුතුය.

20.8. **<u>සම්පූර්ණ ගිවිසුම සහ විශ්වාසය නොතැබීම</u> :**

ස්වකීය විෂය කරුණු සම්බන්ධයෙන් මෙම ගිවිසුම සමස්ත ගිවිසුම වන අතර, එම විෂය කරුණු පිළිබඳ පාර්ශ්ව අතර වූ සියලු පූර්ව ගිවිසුම් ප්‍රතියෝජනය කරනු ලබන අතර, එකී ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට මිස අප විසින් හෝ අප වෙනුවෙන් කරනු ලබන

හෝ කරනු ලබන බවට උද්දේශිත වෙනත් කිසිදු වාචික හෝ ලිඛිත නියෝජනයක් හෝ වගකීමක් පිළිබඳව ඔබ විසින් විශ්වාසය තබා නොමැත.

**20.9. අනනුකූලතාවය :**

(අ) මෙම සම්මත නියමයන් සහ අදාළ සේවා පිළිබඳ අතිරේක කොන්දේසි හෝ වෙනත් යම් ඉල්ලුම්පත්‍රයක සඳහන් වෙනත් යම් නියමයන් සහ කොන්දේසි අතර යම් අනනුකූලතාවයක් පැවතිය හොත්, පසුව සඳහන්වන නියමයන් සහ කොන්දේසි බලාත්මක වේ;

(ආ) මෙම සම්මත නියමයන් සහ අදාළ ප්‍රාදේශීය උපකාරක නියමයන් අතර යම් අනුකූලතාවයක් පැවතියහොත් එවිට, ප්‍රාදේශීය උපකාරක නියමයන් බලාත්මක වේ; සහ

(ඇ) ගිවිසුමේ ඉංග්‍රීසි අනුවාදය සහ යම් පරිවර්තනයන් අතර අනුකූලතාවයක් පැවතියහොත් එවිට ඉංග්‍රීසි පරිවර්තනය බලාත්මක වේ.

**20.10. වෙනස් කළ හැකි බව :**

ගිවිසුමේ හෝ සේවාවෙහි යම් වෙනසක් සහ එම වෙනස්කම බලාත්මක වන දිනය අප විසින් ඔබට දැනුම් දෙනු ලැබේ.

**20.11. විභේද්‍යකරණය :**

ගිවිසුමේ යම් නියමයක් යම් අධිකරණ බලප්‍රදේශයක දී අවලංගු, බලාත්මක නොවන හෝ නීති විරෝධී වේ නම්, එම නියමය පමණක් එම අධිකරණ බලප්‍රදේශයට පමණක් වෙන්කර තබනු ලැබේ.

**20.12. සාමූහික අයිතිවාසිකම් :**

ගිවිසුම යටතේ වන පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම්, වෙනත් ඕනෑම අයිතිවාසිකමකට අමතරව ගිවිසුමට ස්වාධීනව වන්නේ ය.

**20.13. අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම :**

මෙම ගිවිසුම යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිකර්මයක් අප විසින් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරනු නොලබන අවස්ථාවක දී, අප විසින් ම එම අයිතිය හෝ ප්‍රතිකර්මය ප්‍රමාද වී ක්‍රියාත්මක කරනු ඇත.

**20.14. අනුපිටපත් :**

ගිවිසුමට පිටපත් ගණනාවක් අන්තර්ගත විය හැකි අතර, එම පිටපත් ගිවිසුමෙහි එක් හෝ වැඩි පාර්ශ්ව ගණනාවක් විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එම අත්සන් කරන ලද පිටපත් එක් ලේඛනයක් සංයුක්ත කරනු ලබයි.

**20.15. තුන්වන පාර්ශ්ව අයිතිවාසිකම් :**

ගිවිසුමෙහි අන්‍යාකාරයකින් ප්‍රකාශකර ඇත්නම් මිසඃ

(අ) මෙම ගිවිසුමේ පාර්ශ්වයක් නොවන යම් තැනැත්තකු වෙත ඒ යටතේ වූ යම් ප්‍රතිලාභයක් භුක්තිවිඳීමට හෝ බලාත්මක කරවා ගැනීමට අයිතියක් නොමැත; සහ

(ආ) මෙම ගිවිසුමේ පාර්ශ්වයක් නොවන යම් තැනැත්තකුගේ කැමැත්ත එම ගිවිසුම සංශෝධනය සඳහා අවශ්‍ය නොවේඃ

**21. අතරමැදියන්**

**21.1. ඔබ තුන්වන පාර්ශ්වයක් වෙනුවෙන් ක්‍රියා කරනු ලබන අතරමැදියකු නම්, ඔබ විසින් :**

(අ) ඔබ විසින් අපට නියෝජනය කරනුයේ,

(i) යම් අදාළ නීතියක් හෝ ඕනෑම අධිකාරියක නියෝගයක් ප්‍රකාරව ඔබගේ ගනුදෙනුකරු පිළිබඳ සියලු විමසීම් සහ වෙනත් මුදල් විශුද්ධිකරණ විරෝධී පරික්ෂා කිරීම් ඉටුකර ඇති බවට සහ (තුන්වන පාර්ශ්ව අනන්‍යතාව තහවුරුකිරීම සහ අරමුදල් ප්‍රභවය මෙන් ම එම තුන්වන පාර්ශ්ව ගනුදෙනුවල ස්වභාවය ඇතුළුව) ඔබගේ අභ්‍යන්තර ප්‍රතිපත්ති ඉටුකර ඇති බවට; සහ

(ii) තුන්වන පාර්ශ්වය විසින් යෙදී සිටින යම් සැක කටයුතු ක්‍රියාකාරකම් අනාවරණය කරගෙන වාර්තා කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගෙන ඇති බවට;

(ආ) ඉහත (අ) උප-ඡේදයේ සඳහන් තොරතුරු යාවත්කාලීන කර ඇති බවට අප වෙත සහතික විය යුතුය.

මෙහි සිංහල හා ඉංග්‍රිසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට ඉංග්‍රිසි භාෂා පාඨය බලපැවැත්විය යුතුය.